# කොළඹ විශ්වවිද්‍යාලයය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී වූ උපාධි පරීක්ෂණය පළමු වසර- 2018 (පුනර්)

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය- I

(කාලය පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව :07

ඕනෑම ප්‍රශ්න <u>හතරක් (04)</u> සඳහා <u>පමණක්</u> පිළිතුරු සපයන්න

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

1. " නීතියේ ආධිපත්‍ය නම් සංකල්පය මෑතකාලීනව ස්වායක්තව ගොඩනැගී තිබේ. අන්තර්ජාතික නියෝජිත ආයතනයන් විසින් එය දැඩිව ප්‍රශංසාවට ලක් කරමින් අරගල සහිත, පශ්චාත් යුදමය සහ සංක්‍රාන්තිකමය සමාජයන් විෂයෙහිලා අවධාරණය කරමින්, දේශපාලනඥයින් හා නීතිඥයින්, විශේෂයෙන්ම ලොව පුරා සිටින විනිශ්චයකාරවරුන් එකී සංකල්පය සාකච්ඡාවට බඳුන් කර ඇත."

   ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය වර්ධනය කිරීමෙහිලා මෙම සංකල්පය කොතෙක් දුරට බලපෑම් කර තිබේ දැයි සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර ප්‍රායෝගික උදාහරණ මගින් තහවුරු කරන්න.

2. නීතිය මත පදනම් වූ ආණ්ඩුක්‍රම ව්‍යුහයක් තුළ, ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණමය වශයෙන් ආණ්ඩුවේ බලතල වර්ගීකරණය කිරීම බොහෝවිට සංකල්පමය වශයෙන් අසීරුතා ඇති කළ ද, නීති සම්පාදනය නීති ක්‍රියාත්මක කිරීම සහ නීතිය පසිඳලීම යන මූලික කාර්යයන් විභේදනය කර දැක්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ව්‍යුහය හා කාර්යපටිපාටිය තුල ,තවදුරටත් වැදගත්කමක් උසුලයි. මෙකී විභේදනයන් අතහැර දමන්නේ නම්, එනයින් නීතිය නම් සංකල්පයේ පැවැත්මද අවසන් වනු ඇත.

   ශ්‍රී ලංකාවේ බලතල බෙදීම පිළිබද න්‍යායට විශේෂ අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණයය කරන්න.

3. ශ්‍රී ලංකාවේ සමකාලීන සන්දර්භයට පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය නොගැලපෙන බව බොහෝ අවස්ථාවන්හි දී තර්ක කර ඇත. කෙසේ වුවද ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යූහය තුළ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පවත්නා බවට හැඟීමක්, ශ්‍රී ලංකාවට බලපෑම් කර ඇති සම්ප්‍රදායන් තවදුරටත් පවත්වා ගනියි. ඇතැමුන් ප්‍රකාශ කරන්නේ අධිකරණය, නීති සම්පාදකයින් බවට පත්වීම වළක්වා ගැනීම පිණිස පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය පවත්වා ගත යුතු බවයි.

ඉහත ප්‍රකාශයේ වලංගුතාවය පිළිබඳ අදහස් දක්වන්න. ඔබගේ පිළිතුර පශ්චාත් ස්වාධීන ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ගෙන් ලබාගත් උදාහරණ මගින් තහවුරු කරන්න.

4. සමාජයේ වර්ධනය හා විකාශනය උදෙසා මෙන්ම බලය මෙහෙයවන පුද්ගලයන් විසින් යහපාලනය තහවුරු කිරීමෙහිලා අධිකරණය ඉතා හොඳින් පිළිගත් භූමිකාවක් ඉටු කර ඇත. ඒ අනුව, ඇතැම් විට ස්වාධීන අධිකරණයක භූමිකාවෙහි ඇති වැදගත්කම මෙන්ම නිදහස් සමාජයකට අවැසි අවසානාත්මක ඉලක්කය සහ යහපාලනය පිළිබඳ වෙනස් මතවාදයන් දෙකක් පැවතිය නොහැකිය.

ඔබ එක්හවන්නෙහි ද? ඔබගේ පිළිතුර ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එවැනි ස්වාධීනතාවක් පවත්වා ගැනීමට උපකාරී වන සාධකයන් හඳුනාගත යුතුය.

5. හැරී සෙරෙනිලන්තයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවකයෙක් විය. ඔහුගේ පත්වීමේ ලිපිය දක්වන්නේ ඔහු සෙරෙනිලන්තයේ ප්‍රධාන වශයෙන් භාවිතා වන x හා y භාෂා ද්විත්වයෙහිම නිපුණතාවය ලබාගතයුතු බවයි. ඔහුගේ පත්වීමෙන් වසර 5කට පසුව උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලිපියක් මගින් දන්වා සිටින්නේ ඔහු y භාෂාව පිළිබඳ නිපුණතාවය ලබාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ සේවය අවසන් කරන බවයි. හැරී ප්‍රකාශ කර සිටින්නේ ඔහු එකී භාෂා නිපුණතාවය ලබා තිබේදැයි යන්න තීරණය කිරීම පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිසි ඇගයුම් ක්‍රමවේදයක් භාවිතා නොකළ බවත් එබැවින් ඔහුගේ සේවය අවසන් කිරීම අසාධාරණ සහ අයුක්තිසහගත වන බවත්ය. මෙකී තත්වයෙන් දැඩි කළ කලකිරීමට පත් හැරී "සෙරෙනිලන්ත ඩේලි නම් පුවත්පතට" උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එහි භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ විවේචනය කරමින් විශේෂාංග ලිපියක් රචනා කරයි. එකී විශේෂාංග ලිපිය තුළ උසස් අධ්‍යාපන අමාත්‍ය පෙරේරා මහතාව ද විවේචනයට ලක් කරයි. ලිපිය පළ වූ දිනට පසු දින අමාත්‍යවරයාව විවේචනය කිරීම හේතුවෙන් පොලිසිය හැරීව අත්අඩංගුවට ගන්නා ලදී. ඔහුගේ අයිතිවාසිකම් කඩ වී ඇති බව හැරී විශ්වාස කරයි.

සෙරෙනිලන්තයේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බව උපකල්පනය කරමින් හැරීට උපදෙස් දෙන්න.

6. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 19 වන සංශෝධනය හඳුන්වාදීම මගින් විධායක ජනාධිපතිධුරයෙහි බලතල සීමා කරන අතරම, යහපාලනය ඉහළ නැංවීම චේතනා කළේය.

ඔබ එකඟවන්නෙහි ද? 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙ හි <u>ප්‍රධාන ලක්ෂණ තුනක්</u> ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

7. පහත දෑ අතරින් **<u>ඕනෑම දෙකක්(02)</u>** සම්බන්ධයෙන් **<u>පමණක්</u>** සටහන් ලියන්න

අ) ආණ්ඩුක්‍රමව්‍යවස්ථානුකූලවාදය

ආ) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක කාරක සභා

ඇ) මූලික අයිතිවාසිකම් පෙත්සමක නෛතික ස්ථිතිය (*locus standi*)

*******************************